

# 2024
# ජනාධිපතිවරණය
# මහජන අභිලාෂයන්

# ජනාධිපතිවරණය 2024:
# මහජන අභිලාෂයන්

මැතිවරණ සම්බන්ධයෙන් රටේ පවත්නා නීති හා රෙගුලාසිවලට ගරු කරමින්
මැතිවරණ කොමිෂන් සභාවේ මාර්ගෝපදේශය මත මෙම වාර්තාවේ
සමහර සොයාගැනීම් ඉවත් කරනු ලැබ ඇත. අතර ඒ හේතුකොටගෙන පාඨකයාට
සිදුවන අපහසුතාවය සම්බන්ධයෙන්
නීතිය හා සමාජ භාරය සිය කණගාටුව පළකර සිටියි.

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

## පර්යේෂණ කණ්ඩායම

**ප්‍රධාන පර්යේෂකයින්**

විදුර මුණසිංහ
උපුල් වික්‍රමසිංහ

**පර්යේෂණ සම්බන්ධීකාරකවරු**

දමිත් චතුරංග ප්‍රේමරත්න
සෙල්වරත්නම් නිශාන්තනී

**දත්ත විශ්ලේෂකයින්**

චම්පික සමරවික්‍රම
තත්සරණි සඳරේඛා හඳපාන්ගොඩ
මනුලි ලාවන්‍යා සිරිකුමාර
මහේෂ් කුලසිංහ

**ක්ෂේත්‍ර සහායකයින්**

ඇන්ඩි පරමේස්වරම්
අශාන් හසිත කුමාර
බාලසුබ්‍රමනියම් සජිත්‍රා
චමිලා චාන්දනී තිලකරත්න
චම්පික සමරනායක
ඩී.එම්. නිපුන් යසස්
ඩී.ආර්.පී. කුමාර
ඩී.ඒ. සුරේන් ක්‍රිෂාන්ත්
දමිත් චතුරංග ප්‍රේමරත්න
දිනූෂ මදුවන්ත දසනායක
ෆාතිමා හස්නා හස්බුල්ලා
ජී. ශෂීමා තිලක්ෂි
ඉරේෂා සුභාෂිණී මැණිකේ
ජේ.එච්.එම්. හස්රාන්
ජෝසප් ගොඩ්වින් ජුස්මිකන්
කේ. ශෂී ප්‍රභාත්
කහගල්ලගේ සුනිල් ප්‍රේමදාස
මයිකල් ලූසියා
එම්.ජී. ජයන්ත කුමාර
සුනෙත් අරුණ කුමාර
තත්සරණි සඳරේඛා හඳපාන්ගොඩ
තවරාසා සුජේසන්
තිළිණ ක්‍රිෂ්මාල් කොස්තා
ඉරේෂා සුභාෂිණී මැණිකේ
ජේ.එච්.එම්. හස්රාන්
ජෝසප් ගොඩ්වින් ජුස්මිකන්
කේ. ශෂී ප්‍රභාත්
කහගල්ලගේ සුනිල් ප්‍රේමදාස
මයිකල් ලූසියා
එම්.ජී. ජයන්ත කුමාර
එම්.එච්. රහ්නා ෆාතිමා
එම්. ජනනි
එම්.එම්. ෂාෆි
මනුලි ලාවන්‍යා සිරිකුමාර
මේරියන් ප්‍රදීපා සුදර්ශනී කුන්ගේ
සේනාපති දුලිප් රසාංගජීව
සිතුමිණි මෙන්ඩිස්
සුමති නිරුජන්
සුනෙත් අරුණ කුමාර
තත්සරණි සඳරේඛා හඳපාන්ගොඩ
තවරාසා සුජේසන්
තිළිණ ක්‍රිෂ්මාල් කොස්තා
වී. පී. ෂෙහාන් කාවින්ද
වාසුදේවන් වසන්තරාජ්
විවේකා විජයකුමාර්

ජනාධිපතිවරණය 2024ඃ මහජන අභිලාෂයන්

නීතිය හා සමාජ භාරය, 2024

ISBN 978-624-5545-30-8

නීතිය හා සමාජ භාරය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රවර්ධනය, නෛතික හා සමාජ පර්යේෂණ හා උද්දේශනයේ වසර 40 කට වැඩි කාලයක් තිස්සේ නිරතව සිටින ලාභ නොලබන ආයතනයකි. අපගේ මූලික අරමුණ වන්නේ පර්යේෂණ හා උද්දේශනය සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කරමින් මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම, රාජ්‍ය වගවීම වැඩිදියුණු කිරීම සහ නීතියේ පාලනය වෙනුවෙන් කටයුතු කිරීමයි.

කවරය : භාතිය පෙරේරා

ග්‍රැෆික් : චම්පිකා සමරනායක

ධනුශ්‍රී වැලිකල

පිටු සැකසුම : මුත්තයියා කන්දරූබන්

ප්‍රකාශනයඃ

LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

3, කින්සි ටෙරස්,
කොළඹ 08.
දුරකථනඃ (+94) 11 268 48 45
ෆැක්ස්ඃ (+94) 11 268 68 43
වෙබ්ඃ www.lstlanka.org

## ස්තුතිය

මෙම පර්යේෂණ ක්‍රියාවලිය පුරාවටම ලබා දුන් සහයෝගය සහ අඛණ්ඩ මගපෙන්වීම වෙනුවෙන් පර්යේෂණ කණ්ඩායම නීතිය හා සමාජ භාරයේ විධායක අධ්‍යක්ෂ සකුන්තලා කදිර්ගාමර්ට සහ වැඩසටහන් සහ මෙහෙයුම් අධ්‍යක්ෂ සඳුන් තුඩුගලට ස්වකීය ස්තුතිය පුදකරයි. මෙම පර්ෂණයේ විවිධ අවධීන්හි දී විතුර්ෂා කමලේෂ්වරන්, චතුරිකා සෙව්වන්දි, ප්‍රභාත් හේමන්ත, මාලිංග ජයරත්න, අරෝෂා වාසල සහ මඩසාමි විජේකාන්ත් විවිධ අයුරින් සහයෝගය දැක්වූහ. නීතිය හා සමාජ භාරයේ මානව සම්පත් අංශය සහ මූල්‍ය අංශය මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දුන්නේය. අවසාන වශයෙන්, මෙම සමීක්ෂණයට සහභාගී වී තම අනාගත දේශපාලන හා සමාජ අපේක්ෂාවන් විවෘතව ප්‍රකාශ කරමින් ප්‍රතිචාර දැක්වූ සියලු දෙනාගේ සහයෝගය නොලැබෙන්නට මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීමට නොහැකි වනු ඇති බව ද සඳහන් කරමින් එම සියලු දෙනාට පර්යේෂණ කණ්ඩායම ස්වකීය ස්තුතිය පුදකර සිටියි.

**පටුන**

කෙටි යෙදුම්.......... viii
වගු සහ රූප සටහන්.......... ix
හැඳින්වීම.......... 01
ක්‍රමවේදය.......... 03
අධ්‍යයන ප්‍රතිඵල සහ සාකච්ඡාව.......... 10
සමාලෝචනය.......... 26

**කෙටි යෙදුම්**

මැතිවරණ කොමිසමේ මාර්ගෝපදේශය මත ඉවත් කරනු ලැබිනි.

**වගු සහ රූපසටහන්**


01 වෙනි වගුව : එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයෙන් ප්‍රතිචාර දැක්වූවන් සංඛ්‍යාව
01 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව සිංහල නියැදියේ සංයුතිය
02 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකා දෙමළ නියැදියේ සංයුතිය
03 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකා මුස්ලිම් නියැදියේ සංයුතිය
04 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව මලයග දෙමළ නියැදියේ සංයුතිය
05 වෙනි රූපසටහන : එක් එක් ජනවාර්ගික නියැදියේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංයුතිය
06 වෙනි රූපසටහන : සිංහල නියැදිය තුළ එක් එක් වයස් කාණ්ඩය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව
07 රූප සටහන : ශ්‍රී ලංකා දෙමළ නියැදිය තුළ එක් එක් වයස් කාණ්ඩය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව
08 වෙනි රූපසටහන : මුස්ලිම් නියැදිය තුළ එක් එක් වයස් කාණ්ඩය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව
09 වෙනි රූපසටහන : මලයග දෙමළ නියැදිය තුළ එක් එක් වයස් කාණ්ඩය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව
10 වෙනි රූපසටහන : එක් එක් ජනවාර්ගික නියැදිය තුළ ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට තීරණය කිරීම
11 වෙනි රූපසටහන : ජනතාව ඡන්දය දෙන්නේ කාටද
12 වෙනි රූපසටහන : සිංහල ප්‍රජාවගේ මනාපය
13 වෙනි රූපසටහන : එක් එක් අපේක්ෂකයා සඳහා සිංහල නියැදියේ බෙදීයාම
14 වෙනි රූපසටහන : ශ්‍රී ලංකා දෙමළ ජනතාවගේ මනාපය
15 වෙනි රූපසටහන : එක් එක් අපේක්ෂකයා සඳහා ශ්‍රී ලංකා දෙමළ නියැදියේ බෙදීයාම
16 වෙනි රූපසටහන : මුස්ලිම් ඡන්දදායකයින්ගේ මනාපය
17 වෙනි රූපසටහන : එක් එක් අපේක්ෂකයා සඳහා මුස්ලිම් නියැදියේ බෙදීයාම
18 වෙනි රූපසටහන : මලයග දෙමළ ඡන්දදායකයින්ගේ මනාපය
19 වෙනි රූපසටහන : එක් එක් අපේක්ෂකයා සඳහා මලයග දෙමළ නියැදියේ බෙදීයාම
20 වෙනි රූපසටහන : 2024 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දෙන කරුණු
21 වෙනි රූපසටහන : සිංහල නියැදියේ ප්‍රමුඛතා
22 වෙනි රූපසටහන : ශ්‍රී ලංකා දෙමළ නියැදියේ ප්‍රමුඛතා
23 වෙනි රූපසටහන : මුස්ලිම් නියැදියේ ප්‍රමුඛතා

මැතිවරණ කොමිසමේ මාර්ගෝපදේශය මත ඉවත් කරනු ලැබිනි.

24 වෙනි රූපසටහන : මලයග දෙමළ නියැදියේ ප්‍රමුඛතා
25 වෙනි රූපසටහන : 2024 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු
26 වෙනි රූපසටහන : 2019 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු
27 වෙනි රූපසටහන : 2015 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු
28 වෙනි රූපසටහන : 2005 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු
29 වෙනි රූපසටහන : මූලික තොරතුරු මූලාශ්‍රය (සිංහල)
30 වෙනි රූපසටහන : මූලික තොරතුරු මූලාශ්‍රය (ශ්‍රී ලංකා දෙමළ)
31 වෙනි රූපසටහන : මූලික තොරතුරු මූලාශ්‍රය (මුස්ලිම්)
32 වෙනි රූපසටහන : මූලික තොරතුරු මූලාශ්‍රය (මලයග දෙමළ)
33 වෙනි රූපසටහන : පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (සිංහල)
34 වෙනි රූපසටහන : පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (ශ්‍රී ලංකා දෙමළ)
35 වෙනි රූපසටහන : පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (මුස්ලිම්)
36 වෙනි රූපසටහන : පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (මලයග දෙමළ)

## හැඳින්වීම

1948 වර්ෂයේ දී නිදහස ලැබූ දා සිට ශ්‍රී ලංකාව "පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය" යනුවෙන් ද හඳුන්වනු ලබන ලිබරල් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතිය ප්‍රවර්ධනය කරමින් සිටින අතර, එම ආකෘතිය තුළ මැතිවරණ වලින් තේරී පත්වන මහජන නියෝජිතයින්ට ජනතාවගේ දේශපාලන අපේක්ෂාවන් නියෝජනය කිරීමේ බලය ලබා දී තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිත උරුමයන් තිබෙන වෙනත් බොහෝ රටවල ද මෙම ප්‍රවණතාවය කැපී පෙනෙයි. කෙසේ වෙතත්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකාව සතු අත්දැකීම මගින් එම ක්‍රමයෙහි තිබෙන සම්පූර්ණ අසාර්ථකත්වය පිළිබඳ අපමණ සාක්ෂි සපයා දෙයි. ප්‍රභූ ග්‍රහණයෙන් පීඩාවට පත්ව තිබෙන පාර්ලිමේන්තුව වැනි එහි ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දූෂිත ප්‍රභූ දේශපාලනඥයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් සේවය කරමින්, මහජන විරෝධී සහ පොදු ජනතාවට පීඩාකාරී ආකාරයෙන් ක්‍රියාත්මක වේ (උයන්ගොඩ, 2024)[1]. 2022 වර්ෂයේ දියත් කරන ලද අරගලය ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ අසාර්ථකත්වය පිළිබඳ ජනතාව තුළ ඇති කලකිරීම වඩාත්ම මෑතකාලීනව සහ වඩාත්ම තීව්‍ර ලෙස ප්‍රකාශයට පත්වූ අවස්ථාව විය.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක් තුළ, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන වලට නියෝජිතයන් තෝරා පත් කර ගැනීමේදී මැතිවරණ අතිශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, 1978 වර්ෂයේ දී විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වාදීමත් සමග සහ විධායක ජනාධිපතිවරයාට අධික බලතල ලබාදීමත් සමග, ශ්‍රී ලංකාවේ අනෙකුත් මැතිවරණවලට සාපේක්ෂව ජනාධිපතිවරණයට ඉහළ වැදගත්කමක් සහ අවධානයක් ලැබී තිබේ. එළඹෙන 2024 ජනාධිපතිවරණය, මහජන විරෝධතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයෙකු හෝ අග්‍රාමාත්‍යවරයෙකු ඉල්ලා අස්වූ එකම අවස්ථාව වූ 2022 අරගලයෙන් පසුව එළඹෙන පළමු මැතිවරණය වන බැවින් එය වඩාත් වැදගත් මැතිවරණයක් වේ. මෙම එළඹෙන මැතිවරණය මූලික වශයෙන් ම "එක් පැත්තක දෙකොන් සටනක්" හෝ "දෙපැත්තක දෙකොන් සටනක්" වූ මින් පෙර පැවති ජනාධිපතිවරණ වලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වන, "දෙපැත්තක තුන්කොන් සටනක්" (පීරිස්, 2024)[2] වනු ඇති බවට දේශපාලන විශ්ලේෂකයෝ අදහස් පළකරති. පීරිස් පෙන්වා දෙන පරිදි, එය තුන්කොන් සටනක් වන්නේ ජයග්‍රහණය කිරීමට තරග කරන ප්‍රධාන අපේක්ෂකයන් තිදෙනකු සිටින බැවිනි. එනම් රනිල් වික්‍රමසිංහ, සජිත් ප්‍රේමදාස සහ අනුර කුමාර දිසානායක එය තිදෙනා ය. නමුත් එහි තිබෙන්නේ පුළුල් දේශපාලන ව්‍යාපෘති දෙකක් පමණි. 2022 වර්ෂයේ දී ජනතාව නැගී සිටිමින් එරෙහි වූ දේශපාලන සංස්කෘතිය නියෝජනය කරන රනිල් වික්‍රමසිංහ (සහ එක්සත් ජාතික පක්ෂය) සහ සජිත් ප්‍රේමදාස (සහ සමගි ජන සන්ධානය/එක්සත් ජනතා සන්ධානය/සමගි ජන බලවේගය) සහ එම සංස්කෘතියට විරුද්ධ මත දරන්නන් නියෝජනය කරන අනුර කුමාර දිසානායක (සහ ජාතික ජන බලවේගය) එම ව්‍යාපෘති දෙක නියෝජනය කරති. එබැවින් මෙය දෙපැත්තක සටනකි. මෙය ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනකු පමණක් සිටි පෙර පැවති ජනාධිපතිවරණවලට වඩා වෙනස් බව පැහැලි ය.

මේ සන්දර්භය තුළ, ප්‍රධාන අපේක්ෂකයන් තිදෙනා අතර දැඩි තරගයක් මතුවී තිබෙන අතර,

1 https://www.anidda.lk/2024/06/11/%E0%B6%B4%E0%B7%8A%E0%B6%BB%E0%B6%A2%E0%B7%8F%E0%B6%AD%E0%B6%B1%E0%B7%8A%E0%B6%AD%E0%B7%8A%E0%B6%BB%E0%B7%80%E0%B7%8F%E0%B6%AF%E0%B6%BA-%E0%B6%B4%E0%B7%8A%E0%B6%BB%E0%B6%A2-2/

2 https://polity.lk/2024-presidential-election-two-cornered-three-way-fight-pradeep-peiris/

මැතිවරණයට තවත් ඇත්තේ මාසයකටත් අඩු කාලයක් වුවත්, ශ්‍රී ලංකාවේ 9 වෙනි විධායක ජනාධිපතිවරයා කවුරුන් වනු ඇත්ද යන්න අනුමාන කිරීම අසීරුවී තිබේ. මඩ ප්‍රචාර, සදාචාර විරෝධී පක්ෂ මාරුකිරීම්, මූල්‍ය අවභාවිතය සහ වෙනත් මැතිවරණ අවභාවිතයන් වලින් සපිරි අශෝභන දේශපාලන සංස්කෘතිය මෙම තරගයේ දී ද කළඑළි බැස ඇති නමුත්, එහි යහපත් ලක්ෂණ ද නැතුවා නොවේ. අපේක්ෂකයන්ගේ සහ ඔවුන්ගේ පක්ෂවල ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් දැන ගැනීමට ජනතාව පෙරට වඩා උනන්දු වෙමින්, ඒවා ප්‍රශ්න කිරීමට සහ අභියෝග කිරීමටත් ඉදිරිපත්ව සිටිති. අනෙක් අතට, ජනතාව ස්වකීය දේශපාලන අපේක්ෂාවන් මොනවාද යන්නත්, අපේක්ෂකයන් බලයට පත් වුව හොත් ඔවුන්ගෙන් සහ ඔවුන්ගේ පක්ෂවලින් තමන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්නත් විවෘතව කථාබහ කරති. මේ තත්ත්වය ජනතාවගේ දේශපාලන සවිඥානකත්වය අතින් මෙම පරිවර්තනය 1931 වර්ෂයේ දී සර්වජන ඡන්ද බලය හඳුන්වාදීමෙන් පසුව ශ්‍රී ලංකාවේ ඇතිවූ වඩාත්ම කැපී පෙනෙන ප්‍රජාතන්ත්‍රවාදී සිදුවීම වන 2022 වර්ෂයේ අරගලයෙහි සෘජු ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක (කෝර්ෆ් සහ තවත් අය, 2024)[3]. මෙම අධ්‍යයනය මගින්, අනෙකුත් කරුණු අතර, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සමග ජනතාව ගණුදෙනු කරන ආකාරය තුළ මෙම පරිවර්තනය පිළිබිඹු වන්නේ කෙසේද යන්න විමසා බැලීමටද උත්සාහ කරයි.

එළැඹෙන 2024 ජනාධිපතිවරණය පෙර පැවති මැතිවරණවලට සාපේක්ෂව ඉතාමත් තීරණාත්මක සහ තීව්‍ර වන බැවින්, තමන් ඡන්දය දීමට අදහස් කරන්නේ කාටද යන්න පිළිබඳව ඡන්දදායකයින් තුළ තිබෙන අවබෝධයන් සහ ඔවුන්ගේ තීරණය කෙරෙහි බලපාන සාධක අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. මූලික වශයෙන් ම, ජයගන්නා අපේක්ෂකයා කවුද යන්න පිළිබඳ අනාවැකි කීම අරමුණු කර ගනිමින් 2024 ජනාධිපතිවරණය පිළිබඳව මෑතක දී ප්‍රකාශයට පත් කර ඇති බොහෝ සමීක්ෂණ සහ මත විමසුම් සමග සසඳා බැලීමේ දී, මෙම අධ්‍යයනය මගින් ජනතාව ඡන්දය දීමට ජනාධිපති අපේක්ෂකයින් තෝරා ගන්නා විට ප්‍රමුඛත්වය ලබා දෙන කරුණු මොනවාද යන්නත්, කාලයත් සමග සහ ජන වාර්ගිකත්වය, වයස සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනාදී ගතිකයන් අනුව එම ප්‍රමුඛතා වෙනස් වී ඇති ආකාරයත් ගවේෂණය කිරීමට උත්සාහ කරයි.

3 Korf, B., Rambukwella, H., Peiris, P., de Mel, N., Sivamohan, S., Schenk, C., Wijewardene, S., Kadirgamar, A., and Geiser, U. 2024. The ‘Cultural Life’ of Democracy in Sri Lanka (And Beyond). Geopolitics, 1–48. https://doi.org/10.1080/14650045.2024.2379306

**ක්‍රමවේදය**

1983 කළු ජූලියෙන් පසු ශ්‍රී ලාංකාවේ දේශපාලන පර්යාය ප්‍රධාන වශයෙන් ම ජනවාර්ගික ගැටුම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ජාතිකවාදයන් මගින් හැඩගස්වා, අධිනිශ්චය කර ඇති බව බොහෝ දෙනාගේ පිළිගැනීම වේ (ගුණසිංහ 1986; ගුණවර්ධන 2020)[4]. ඡන්දදායකයින් අතර ජනවාර්ගික ධ්‍රැවීකරණයන් අවසාන ජයග්‍රාහකයා තීරණය කිරීමේදී තීරණාත්මක භූමිකාවක් ඉටු කළ බව පෙර පැවති ජනාධිපතිවරණ වලින් පැහැදිලි වේ. විශේෂයෙන් ම 2005 සහ 2015 මැතිවරණවල දී උතුරේ ද, 2019 මැතිවරණයේ දී දකුණේ ද එය පෙනෙන්නට තිබුණි. මෙම කරුණ පදනම් කරගෙන, මෙම සමීක්ෂණයට විශාලත්වය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධානම ජනවර්ග හතර නියෝජනය කරන වෙන් වෙන් වූ නියැදි හතරක් යාදා ගන්නා ලදී. සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ශ්‍රී ලංකා මුස්ලිම් සහ මලයග දෙමළ එම ජනවර්ග හතර වේ. අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම් නියෝජනය කරන ප්‍රතිචාර දැක්වූවන් ඉතා සුළු සංඛ්‍යාවක් (n=8) සිටියහ. එය ප්‍රමාණාත්මක වශයෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් නොවූ නිසා ඔවුන් මෙම විශ්ලේෂණයෙන් බැහැර කරන ලදී. ඒ අනුව, මෙම සමීක්ෂණය ජනාධිපතිවරණවලදී ජනතාවගේ ඡන්ද දීමේ චර්යාවන් සහ අවබෝධයන් පිළිබඳව එක් එක් ජනවාර්ගික කණ්ඩායම අතර සංසන්දනය කරනවාට වඩා, එක් එක් ජනවාර්ගික කණ්ඩායම තුළ එකී කාරණා අවබෝධ කර ගැනීමට ප්‍රයත්න දරයි.

දිස්ත්‍රික්ක 25 ට අයත් ග්‍රාම නිලධාරී වසම් 42 ක් අතරින් සමීක්ෂණ ප්‍රතිචාර 2,867 ක් එකතු කරගන්නා ලදී. දත්ත පිරිසිදු කිරීමේ ක්‍රියාවලියේ දී අනුකූල නොවීම හේතුවෙන් ප්‍රතිචාර 69 ක් නොසලකා හරින ලද අතර, අවසාන විශ්ලේෂණය සඳහා ප්‍රතිචාර 2,798 ක් මෙයට යොදාගනු ලැබිනි. එක් එක් දිස්ත්‍රික්කයේ ජනවාර්ගික සංයුතිය නියෝජනය වන පරිදි ග්‍රාම නිලධාරී කොට්ඨාස තෝරා ගනු ලැබිනි. සමස්ත දිස්ත්‍රික්කයේම අතිමහත් බහුතරය එක් ජනවර්ගයකට පමණක් අයත් වන විට එම දිස්ත්‍රික්කයේ එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් තෝරා ගන්නා ලද අතර, දිස්ත්‍රික්කය සැලකිය යුතු ජනවාර්ගික විවිධත්වයකින් සමන්විත වන අවස්ථාවලදී එම දිස්ත්‍රික්කයේ ජනවාර්ගික විවිධත්වය නියෝජනය වන පරිදි ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක් තෝරා ගන්නා ලදී. උදාහරණයක් ලෙස, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් (පලෙයි නගරම්) පමණක් තෝරාගෙන ඇති අතර, කොළඹ දිස්ත්‍රික්කයේ මරදාන, ග්‍රෑන්ඩ්පාස්, සහස්පුර, ලියන්ගොඩ, සහ උන්දුරුගොඩ යන ග්‍රාම නිලධාරී වසම් තෝරාගෙන ඇත.

එක් එක් දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ අනුව සම්බන්ධ කරගනු ලැබූ ප්‍රතිචාරකයින් සංඛයාවන් 01 වෙනි වගුවෙන් දැක්වේ.


| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය | ප්‍රතිචාර දැක්වූ වන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මධ්‍යම පළාත | මහනුවර | උඩපලාත | ගම්පොල බටහිර | 103 |
| 2 | | | ගඟවටකෝරළේ | හීරැස්සගල | 99 |
| 3 | | මාතලේ | උඩපලාත | නිකගොල්ල | 30 |
| 4 | | | උකුවෙල | තවලම්කොය | 27 |
| 5 | | | උකුවෙල | වරකන්ද | 53 |
| 6 | | නුවරඑළිය | නොර්වුඩ් | කර්කොස්වල්ඩ් | 86 |

4 Gunasinghe, N. 1986. Ethnic Conflict in Sri Lanka: Perceptions and Solutions. South Asia Bulletin, vol. 6, no. 2, https://doi.org/10.1215/07323867-6-2-34; Goonewardena, K. (2020). Populism, nationalism and Marxism in Sri Lanka: from anti-colonial struggle to authoritarian neoliberalism. Geografiska Annaler: Series B, Human Geography, 102(3), 289–304. https://doi.org/10.1080/04353684.2020.1780146


| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | නැගෙනහිර පළාත | අම්පාර | දමන | වඩිනාගල | 50 |
| 8 | | | කල්මුණේ | ඉස්ලාමාබාත් | 50 |
| 9 | | මඩකලපුව | කිරාන් | මුරුතන්කර්නි | 100 |
| 10 | | ත්‍රිකුණාමලය | සේරුවිල | නාර්වක්කර්නිකාඩු | 21 |
| 11 | | | | සේරුනුවර | 39 |
| 12 | | | | තංගනගර් | 30 |
| 13 | උතුරු මැද පළාත | අනුරාධපුරය | නොච්චියාගම | නලවගම | 99 |
| 14 | | පොළොන්නරුව | හිඟුරක්ගොඩ | චන්ද්‍රනපොකුණ | 101 |
| 15 | උතුරු පළාත | යාපනය | චූලිපුරම් | තොල්පුරම් බටහිර | 98 |
| 16 | | කිලිනොච්චිය | පලෙයි | පලෙයි නගරම් | 94 |
| 17 | | මන්නාරම | මුසලි | සිලාවතුර | 94 |
| 18 | | මුලතිව් | පුදුකුඩිඉරුප්පු | වල්ලුවර්පුරම් | 106 |
| 19 | | වවුනියාව | වවුනියාව උතුර | නයිනමඩු | 73 |
| 20 | | | වවුනියාව දකුණ | නෙන්දුකුලම | 25 |
| 21 | වයඹ පළාත | කුරුණෑගල | මාවතගම | දෙල්ගොල්ලවත්ත දකුණ | 104 |
| 22 | | පුත්තලම | මාදම්පේ | ගලහිටියාව | 50 |
| 23 | | | කල්පිටිය | ආලන්කුඩා | 56 |
| 24 | සබරගමුව පළාත | කෑගල්ල | දැරණියගල | මියනවිට | 49 |
| 25 | | | වරකාපොල | ඇත්නාවල | 48 |
| 26 | | රත්නපුර | බලංගොඩ | බලංගොඩ | 50 |
| 27 | | | රත්නපුර | පාගොඩ | 50 |
| 28 | දකුණු පළාත | ගාල්ල | හික්කඩුව | මෝදරපටුවත | 99 |
| 29 | | හම්බන්තොට | සූරියවැව | බැදිගම්තොට | 102 |
| 30 | | මාතර | මුලටියන | දේවාලේගම නැගෙනහිර | 99 |
| 31 | ඌව පළාත | බදුල්ල | බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල | 51 |
| 32 | | | මහියංගනය | ගින්නොරුව | 50 |
| 33 | | මොණරාගල | සූරියවැව | මහකළුගොල්ල | 100 |
| 34 | බස්නාහිර පළාත | කොළඹ | කොළඹ | මරදාන | 25 |
| 35 | | | කොළඹ | ග්‍රෑන්ඩ්පාස් උතුර | 24 |
| 36 | | | මහරගම | ලියන්ගොඩ | 50 |
| 37 | | | බොරැල්ල | සහස්පුර | 50 |
| 38 | | | හෝමාගම | උන්දුරුගොඩ | 50 |
| 39 | | ගම්පහ | මීගමුව | මුන්නක්කරය | 45 |
| 40 | | | බියගම | කඳුබොඩ | 105 |
| 42 | | | බියගම | හෙයියන්තුඩුව දකුණ | 60 |
| 43 | | කළුතර | කළුතර | වාද්දුව දකුණ | 75 |
| 44 | | | | කළුතර බටහිර | 28 |
| | එකතුව | | | | 2798 |

01 වෙනි වගුව: එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙන් ප්‍රතිචාර දැක්වූවන් සංඛ්‍යාව


තෝරාගත් දිස්ත්‍රික්ක විසි එකකට (21) අයත් ප්‍රතිචාර දැක්වූවන් 1,574 දෙනෙකුගෙන් සිංහල නියැදිය සමන්විත වූ අතර, ඉන් වැඩිම පිරිසක් (189 දෙනෙක්) සිටින දිස්ත්‍රික්කය ගම්පහ විය. එම නියැදියේ තවත් සැලකිය යුතු ප්‍රතිශතයක් කොළඹ, අනුරාධපුර, කළුතර, කුරුණෑගල, මාතර, පොළොන්නරුව, හම්බන්තොට සහ ගාල්ල යන දිස්ත්‍රික්කවලට අයත් විය. ශ්‍රී ලංකා දෙමළ නියැදිය දිස්ත්‍රික්ක දහසයකට (16) අයත් පුද්ගලයන් 611 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඉන් වැඩි පිරිසක් යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මඩකලපුව සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට අයත් වූවන් වේ. මුස්ලිම් නියැදියෙන් වැඩිම සංඛ්‍යාවක් අම්පාර, පුත්තලම, මන්නාරම, මාතලේ සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට අයත් ග්‍රාම නිලධාරී වසම් 13 ක පුද්ගලයන් 280 ක ගෙන් සමන්විත විය. මලයග දෙමළ නියැදිය දිස්ත්‍රික්ක දොළහකට (12) අයත් පුද්ගලයන් 325 දෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් නුවරඑළිය, මහනුවර, කැගල්ල සහ රත්නපුරය යන දිස්ත්‍රික්කවලට අයත් වූහ. අංක 01 සිට 04 දක්වා වන රූපසටහන් වලින් එක් එක් ජනවාර්ගික නියැදියේ දිස්ත්‍රික් අනුව සංයුතිය පෙන්වයි.





01 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව සිංහල නියැදියේ සංයුතිය




02 වෙනි රූපසටහන: දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකා දෙමළ නියැදියේ සංයුතිය





03 වෙනි රූපසටහන : දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකා මුස්ලිම් නියැදියේ සංයුතිය




04 වෙනි රූපසටහන: දිස්ත්‍රික්ක අනුව මලයග දෙමළ නියැදියේ සංයුතිය


ක්ෂේත්‍ර සහායකයින් 45 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සමීක්ෂණ පත්‍රිකාවක් භාවිතා කරමින් ප්‍රතිචාර දැක්වූවන් සමග මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා සිදු කරමින් දත්ත රැස් කළහ. දත්ත රැස් කිරීම ආරම්භ කිරීමට පෙර, සියලුම ක්ෂේත්‍ර සහායකයින්ට දින භාගයක පුහුණුවක් ලබා දෙන ලද අතර, එහිදී සමීක්ෂණයට අදාළ ප්‍රශ්නාවලිය පිළිබඳ, සැලකිලිමත් විය යුතු සදාචාරාත්මක කරුණු පිළිබඳ සහ අනෙකුත් තාක්ෂණික කරුණු පිළිබඳ ඔවුන් දැනුවත් කරන ලදී. 2019, 2015 සහ 2005 වර්ෂවල පැවති ජනාධිපතිවරණවලදී අපේක්ෂකයා තෝරා ගැනීමේ මූලික සාධකය පිළිබඳව සමීක්ෂණය මගින් විමසා ඇති බැවින්, පසුගිය මැතිවරණ පිළිබඳ මතකය අලුත් කර ගැනීමට ප්‍රතිචාර දැක්වූවන්ට උපකාර කරන ලෙස ක්ෂේත්‍ර සහායකයින් විශේෂයෙන් උපදෙස් දෙන ලදී. දත්ත රැස්කිරීම ආරම්භ කර පළමු දින දෙක ගතවූ පසුව, ඔවුන්ට ක්ෂේත්‍රයේ මුහුණ දීමට සිදුවූ අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා තවත් සැසියක් පවත්වන ලද අතර, ඔවුන් හඳුනාගත් දුෂ්කරතාවලට විසඳුම් ලබා දෙන ලදී. 2024 අගෝස්තු 03 වෙනි දින සිට 14 වෙනි දින දක්වා කාලය තුළ සියලුම දිස්ත්‍රික්කවල දත්ත රැස්කිරීම සිදු විය. ඒ අනුව, සමීක්ෂණය මගින් සොයාගත් කරුණු වලින් නිරූපනය වන්නේ අගෝස්තු 14 දින වන විට පැවැති තත්ත්වයයි. මූලික වශයෙන් ම සමීක්ෂණ පත්‍රිකාව මගින් එකතු කරන ලද ප්‍රමාණාත්මක දත්තවලට අනුපූරකව, ජනතාවගේ අපේක්ෂාවන් වඩාත් විස්තරාත්මකව අවබෝධ කර ගැනීම සඳහා ගුණාත්මක දත්ත ද රැස් කරන ලදී. ඒ අනුව මැතිවරණයේ දී තම තීරණය කෙරෙහි බලපාන සාධක සම්බන්ධයෙන් ජනතාව පළ කළ අදහස් සමීක්ෂණ පත්‍රිකාවේ සටහන් සඳහා වෙන් කර ඇති කොටසේ සටහන් කරගනු ලැබිනි. ක්ෂේත්‍ර දත්ත රැස්කිරීම අවසානයේ දී, ක්ෂේත්‍ර සහායකයින්ගේ නිරීක්ෂණ සහ අත්දැකීම් ප්‍රධාන පර්යේෂකයන් සමග සාකච්ඡා කිරීම පිණිස ක්ෂේත්‍ර සහායකයින් සඳහා සම්පූර්ණ දිනයක සමාලෝචන වැඩමුළුවක් සංවිධානය කරන ලදී. වාර්තාකර ගන්නා ලද ගුණාත්මක ප්‍රතිචාර මෙම සාකච්ඡාවේදී සන්දර්භගත කර, ප්‍රධාන තේමාවන් හඳුනා ගන්නා ලදී.

මෙම නියැදි හතර තුළ ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හැකිතාක් සමාන ලෙස පවත්වා ගැනීමට උත්සාහ දරන ලදී. පොදුවේ ගත් කල, මලයග දෙමළ සහ සිංහල නියැදිවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව අනුපාතයෙහි සැලකිය යුතු තරම් වෙනසක් නොවීය (මලයග දෙමළ - ගැහැණු 52% සහ පිරිමි 48%, 48% පිරිමි, සිංහල - ගැහැණු 49% සහ පිරිමි 51%). ශ්‍රී ලංකා දෙමළ සහ මුස්ලිම් නියැදිවල පිරිමින් සහ කාන්තාවන් අතර අනුපාතවල 10% ට වඩා මඳක් අඩු වෙනසක් තිබුණි (ශ්‍රී ලංකා දෙමළ - කාන්තා 56% සහ පිරිමි 44%, මුස්ලිම් - කාන්තා 45% සහ පිරිමි 55%). එක් එක් නියැදිය ස්ත්‍රී පුරුෂ සමාජභාව අනුව බෙදී ඇති ආකාරය 05 වෙනි රූපසටහන මගින් පෙන්වයි. තම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිරිමි හෝ ගැහැණු වශයෙන් හඳුන්වා නොදුන් ප්‍රතිචාර දැක්වූවන් සංඛ්‍යාව ඉතා අඩුවූ (n = 3) බැවින් පසුව සිදුකරන ලද විශ්ලේෂණයේදී ඔවුන්ව බැහැර කරන ලදී.





05 වෙනි රූපසටහන: එක් එක් ජනවාර්ගික නියැදියේ ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංයුතිය


සෑම ජනවාර්ගික නියැදියකට ම සියලු ම වයස් කාණ්ඩවලට අයත් පුද්ගලයන් ඇතුළත් කර ඇත. එක් එක් ජනවාර්ගික නියැදිය තුළ එක් එක් වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව බෙදී ඇති ආකාරය අංක 06 සිට 09 දක්වා වන රූප සටහන් වලින් පෙන්නුම් කරයි.





06 වෙනි රූපසටහන: සිංහල නියැදිය එක් එක් වයස් කාණ්ඩ අනුව




07 රූප සටහන: ශ්‍රී ලංකා දෙමළ නියැදිය එක් එක් වයස් කාණ්ඩ අනුව




08 වෙනි රූපසටහන: මුස්ලිම් නියැදිය එක් එක් වයස් කාණ්ඩ අනුව




09 වෙනි රූපසටහන: මලයග දෙමළ නියැදිය එක් එක් වයස් කාණ්ඩය අනුව

මැතිවරණ කොමිසමේ මාර්ගෝපදේශය මත ඉවත් කරනු ලැබිනි.


දත්ත රැස් කිරීම ආරම්භ කරන අවස්ථාව වන විටත්, ජීවන් තොණ්ඩමන් නායකත්වය දරන ලංකා කම්කරු කොංග්‍රසය රනිල් වික්‍රමසිංහට සිය සහය දක්වන බව ප්‍රකාශ කර තිබුණි. දත්ත රැස් කිරීම ආරම්භ කර දින තුනකට පසුව, මලයග දෙමළ පක්ෂ නායකයන් වන පලනි දිගම්බරම්, මනෝ ගනේෂන් සහ වී. රාධක්‍රිෂ්ණන් ප්‍රමුඛ දෙමළ ප්‍රගතිශීලී සන්ධානය සජිත් ප්‍රේමදාසට සිය සහාය පළ කළේය. මලයග දෙමළ ප්‍රජාව ජීවත් වන බොහෝ ප්‍රදේශවල (මහනුවර දිස්ත්‍රික්කයේ හීරැස්සගල හැර) දත්ත රැස් කිරීම අගෝස්තු 6 වෙනිදා වන තුරුම ආරම්භ කර නොතිබූ බැවින් මෙම වෙනස්වීම් සමීක්ෂණයට එතරම් බලපෑමක් ඇති කළේ නැත. ඒ අනුව, බහුතර මලයග දෙමළ ජනයාගේ දත්ත රැස් කරන ලද්දේ මලයග ප්‍රජාවේ ප්‍රමුඛ නායකයින් කවර අපේක්ෂකයාට සහාය පළ කරන්නේද යන්න ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව ය.

සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම වෙන් වෙන් වශයෙන් එකතු කරන ලද, ප්‍රතිචාරකයින් 2,867 ක ගේ මූලික දත්ත එකතුව, විෂමතා හෝ වැරදි සමාලෝචනය කර නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ ක්‍රියාවලියකට භාජනය කෙරින. පසුව මෙම එක් එක් ප්‍රතිචාරකයාගේ තොරතුරු අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය, දිස්ත්‍රික්කය සහ පළාත අනුව වෙන්කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීම ආරම්භ කිරීමට පෙර, ප්‍රශ්නාවලියෙහි අන්තර්සම්බන්ධිභාවය කෙරෙහි බලපෑමක් ඇති විය හැකි වීම හේතුවෙන් සහ අවසානයේ එය විශ්ලේෂණයට බලපෑ හැකිවීම හේතුවෙන් ලබා ගත් ප්‍රතිචාරකයින් 69 ක ගේ දත්ත ඉවත් කරන ලදී. ඉතිරි දත්ත ප්‍රමාණය වූ ප්‍රතිචාරකයින් 2,798 ක ගේ දත්ත ප්‍රමිතිගත කරන ලද අතර, ප්‍රධාන උපකල්පන මත පදනම් වූ විවර්තන වගු භාවිතයෙන් එම දත්ත විශ්ලේෂණය කිරීම ආරම්භ කරන ලදී. වඩාත් පැහැදිලිව අවබෝධ කර ගැනීමට හැකි වන පරිදි විවර්තන වගු වලින් ලැබෙන ප්‍රතිඵල, අදාළ

ප්‍රතිශත දක්වමින්, තීරු ප්‍රස්ථාර සහ වට ප්‍රස්ථාර දෙකම භාවිතා කරමින් නිදර්ශනය කරන ලදී. අවශ්‍ය අවස්ථා වලදී, සොයාගැනීම්වල නිරවද්‍යතාව තහවුරු කරගැනීම හා වඩා සවිස්තරාත්මක තොරතුරු ලබාගැනීම සඳහා ගුණාත්මක දත්ත එක්රැස් කිරීමද සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය සහසම්බන්ධතා විශ්ලේෂණය කිරීම මගින් සහ අවශ්‍ය විට ප්‍රතිඵලවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා උප-කල්පන පරීක්ෂා කිරීම මගින් එක් එක් ප්‍රජාව තුළ ඡන්දය ප්‍රකාශ කිරීමේ ගතිකත්වයන් පිළිබඳ පරීක්ෂාවට ඉඩ සලසා දුනි.


## අධ්‍යයන ප්‍රතිඵල සහ සාකච්ඡාව

මෙවර ජනාධිපතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කරන්නේද යන ප්‍රශ්නයට පිළිතුරු දෙමින් තමන් ඡන්දය ප්‍රකාශ කරන බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බොහොමයක් දෙනා කියා සිටියහ. මලයග දෙමළ සහ ශ්‍රී ලංකා දෙමළ ජනතාවගෙන් 97% ක් ම මෙවර තමන් ඡන්දය ප්‍රකාශ කරන බව පැවසූහ. සිංහල සහ මුස්ලිම් ජනවාර්ගික නියැදි අතරින් දැනටමත් ඡන්දය ප්‍රකාශ කිරීමට තීරණයකොට ඇති අයගේ අනුපාතය 90% ක් විය.





10 වෙනි රූපසටහන: එක් එක් ජනවාර්ගික නියැදිය තුළ ඡන්දය ප්‍රකාශ කිරීමට හෝ ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට තීරණය කිරීම

මැතිවරණයේ දී ඡන්දය දෙන්නේ කුමන අපේක්ෂකයාටද යන්න විමසූ විට, සිංහල ජනතාවගෙන් ක් ද, ක් ට ද ඡන්දය දෙන බව පැවසූ අතර, ට ආසන්න පිරිසක් ද, ක් ද තෝරා ගත්හ.





11 වෙනි රූපසටහන: ජනතාව ඡන්දය දෙන්නේ කාටද

සිංහල ජනතාවගේ නියැදියෙන් 27.94% ක් (එනම් 1574 න් 432 දෙනෙක්) තවමත් අපේක්ෂකයෙකු තීරණය කිරීමට නොහැකිව සිටීම වඩාත්ම කැපී පෙනෙන කරුණ විය. තමන් ඡන්දය දෙන අපේක්ෂකයා දැන-ටමත් තීරණය කර ඇති නමුත් තමන්ගේ තේරීම හෙළි කිරීමට අකමැති බව තවත් 12.6% ක් කියා සිටියහ.



12 වෙනි රූපසටහන: සිංහල ප්‍රජාවගේ මනාපය


[redacted] ට ඡන්දය දීමට තීරණය කර ඇති බව පැවසූ සිංහල ඡන්දදායකයන්ගෙන් වැඩි දෙනෙකු තරුණ ඡන්දදායකයන් වීම තවත් වැදගත් කරුණක් විය. [redacted] සහ [redacted] ඡන්දය දෙන බව පැවසූ බොහෝ දෙනා වයසින් වැඩි ඡන්දදායකයෝ වූහ. [redacted] ඡන්දය දෙන බව පැවසූ අය අයත් වන නිශ්චිත වයස් කාණ්ඩයක් හඳුනා ගැනීමට නොහැකි විය.





13 වෙනි රූපසටහන: එක් එක් අපේක්ෂකයා සඳහා සිංහල නියැදියේ බෙදීයාම වයස් කාණ්ඩ අනුව

ශ්‍රී ලාංකා දෙමළ ප්‍රජාවගේ ප්‍රතිචාරය සිංහල ප්‍රජාවට වඩා වෙනස් විය; ඔවුන්ගෙන් ක් තෝරා ගත්හ; තමන් ට ඡන්දය දීමට අපේක්ෂා කරන බව ක් පැවසූහ; ට ඡන්දය දෙන බව පැවසූයේ ක් පමණ පිරිසකි. ට ඡන්දය දෙන බව ඔවුන්ගෙන් ක් ප්‍රකාශ කළහ. නියැදියේ සිටි ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාවේ 611 දෙනාගෙන් පමණක් ට ඡන්දය දෙන බව ප්‍රකාශ කළේය.

නියැදියෙන් වැඩිම පිරිසක් (35.27%) ප්‍රතිචාර දැක්වූයේ තමන් තවමත් තීරණය කර නොමැත යනුවෙන් වීම වඩාත්ම කැපී පෙනෙන කරුණ වේ. තම තීරණය ප්‍රකාශ කිරීමට කැමති නැති බව තවත් 20% ක් කියා සිටියහ. ඒ අනුව, මෙම සමීක්ෂණය මගින් ශ්‍රී ලාංකා දෙමළ ඡන්දදායකයින්ගෙන් 50% ක ගේ (611 න් 334 දෙනෙකුගේ) ඡන්දය ලබා ගන්නේ කුමන අපේක්ෂකයා ද යන්න තීරණය කිරීමට නොහැකි විය.




14 වෙනි රූපසටහන: ශ්‍රී ලංකා දෙමළ ජනතාවගේ මනාපය





15 වෙනි රූපසටහන: එක් එක් අපේක්ෂකයා සඳහා ශ්‍රී ලංකා දෙමළ නියැදියේ බෙදීයාම වයස් කාණ්ඩ අනුව

මුස්ලිම්වරුන්ගෙන් වැඩිම දෙනෙකුගේ තේරීම  විය. ප්‍රතිශතයක් ලෙස එය  ක් විය. ඔවුන්ගෙන්  ක් ට සහ  ඡන්දය දෙන බව පැවසූහ. තමන් තවමත් තීරණය කර නොමැති බව 19.78% ක් කියා සිටි අතර, 21.98% ක් තම තීරණය ප්‍රකාශ කිරීමට කැමති නැති බවත් සඳහන් කළහ.  ට ඡන්දය දෙන බව පැවසූ මුස්ලිම් ජාතිකයන්ගෙන් වැඩි දෙනෙක් තරුණයන් වීම මෙහිදී හඳුනා ගත හැකි වූ තවත් සුවිශේෂී ලක්ෂණයක් විය. එයට සාපේක්ෂව, ට ඡන්දය දෙන බව පැවසූ පුද්ගලයින් මූලික වශයෙන් වයස අවුරුදු 35 ට වැඩි අය වූහ.




16 වෙනි රූපසටහන: මුස්ලිම් ඡන්දදායකයින්ගේ මනාපය





17 වෙනි රූපසටහන: එක් එක් අපේක්ෂකයා සඳහා මුස්ලිම් නියැදියේ බෙදීයාම වයස් කාණ්ඩ අනුව

[redacted] මලයග දෙමළ ප්‍රජාව අතර වඩාත්ම ජනප්‍රිය අපේක්ෂකයා විය. ඔවුන්ගෙන් [redacted] ට ඡන්දය දෙන බව පැවසූ අතර, සියලු වයස් කාණ්ඩවලට අයත් අය ඒ අතර වූහ. [redacted] ක ගේ තේරීම වූ අතර, [redacted] ක ගේ තේරීම විය. තරුණ ඡන්දදායකයන් අතර තිබෙන [redacted] ට ඡන්දය දීමේ ප්‍රවණතාවය මලයග දෙමළ ජනතාව අතර ද තිබෙන බව නිරීක්ෂණය කළ හැක. උදාහරණයක් ලෙස, නියැදියේ සිට වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයින් 46 දෙනාගෙන් කිසිවෙක් [redacted] ට ඡන්දය දෙන බව ප්‍රකාශ කළේ නැත.




18 වෙනි රූපසටහන: මලයග දෙමළ ඡන්දදායකයින්ගේ මනාපය




19 වෙනි රූපසටහන: එක් එක් අපේක්ෂකයා සඳහා මලයග දෙමළ නියැදියේ බෙදීයාම වයස් කාණ්ඩ අනුව

2024 ජනාධිපතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට තීරණය කිරීමේ දී ඡන්දදායකයින් සැලකිල්ලට ගත් ප්‍රධාන කරුණු මොනවාද යන්න මෙම සමීක්ෂණය මගින් විමසන ලදී. ඔවුන් සලකා බැලූ ප්‍රධානතම සාධක තුන (3) ප්‍රමුඛත්වය අනුව තෝරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලද අතර, තෝරා ගැනීම සඳහා වූ වරණයන් වූයේ, ආර්ථිකය සම්බන්ධයෙන් අදාළ අපේක්ෂකයාගේ ප්‍රවේශය, ජාතික ප්‍රශ්නයට ප්‍රවේශය, නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් මැදිහත් වීම, සම්ප්‍රදායිකව තමන්ගේ පවුල එම අපේක්ෂකයාට හෝ ඔහුගේ කඳවුරට ඡන්දය ප්‍රකාශ කර තිබීම, අපේක්ෂකයාගේ ජනවාර්ගිකත්වය සහ ඉහත සඳහන් කළ සාධකවලට අයත් නොවන වෙනත් සාදක යන ඒවා ය. සිංහල, ශ්‍රී ලංකා දෙමළ, මුස්ලිම් සහ මලයග දෙමළ යන නියැදි හතරෙහි ම බහුතරය 2024 ජනාධිපතිවරණයේ දී තම ඡන්දය ප්‍රකාශ කිරීමේදී ආර්ථිකය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ ප්‍රවේශය වඩාත්ම තීරණාත්මක සාධකය බව ප්‍රකාශ කළහ.

ආර්ථිකය සම්බන්ධ ප්‍රවේශය සලකා බලන බවට වැඩිම ප්‍රතිශතයක් (82.35%) ප්‍රතිචාර දැක්වූයේ මලයග දෙමළ ප්‍රජාවේ නියැදිය තුළ ය. අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම් සමග සංසන්දනය කිරීමේ දී අඩුම ප්‍රතිශතයක් (63.74%) පෙන්නුම් කළේ මුස්ලිම් ප්‍රජාවෙහි නියැදිය තුළ ය. තමන් වැඩියෙන් ම සලකා බලන සාධකය වන්නේ නීතියේ ආධිපත්‍යය බව පැවසූ පුද්ගලයින් සංඛ්‍යාව අනෙකුත් ජනවර්ගවලට සාපේක්ෂව ඉහළම ප්‍රතිශතයක් වූයේ මුස්ලිම් ප්‍රජාවගේ නියැදිය තුළ ය (මුස්ලිම් - 17.95%, සිංහල - 10.8%, ශ්‍රී ලංකා දෙමළ - 7.65%, මලයග දෙමළ - 4.64 %).





20 වෙනි රූපසටහන: 2024 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දෙන සාධක

ප්‍රතිචාරකයින්ට තෝරාගැනීම සඳහා ලබා දී තිබූ වරණයන් පුළුල් වූ බැවින්, හැකි සෑම විටම සිය වරණය පැහැදිලි කරන ලෙස සෑම ප්‍රතිචාරකයෙකුගෙන් ම ඉල්ලා සිටින ලද අතර, සවිස්තරාත්මක ප්‍රතිචාර සමීක්ෂණ පත්‍රිකාවේ දී ඇති දත්ත එකතුකරන්නාගේ සටහන් කොටසේ සටහන් කරන ලදී. දත්ත රැස්කිරීම අවසානයේ දී, ප්‍රතිචාරකයින් තෝරාගත් වරණයන් ක්ෂේත්‍ර සහායකයින්ගේ සටහන් ද උපයෝගී කර ගනිමින් ක්ෂේත්‍ර සහායකයින් සමග සවිස්තරාත්මකව සාකච්ඡා කර තේමාත්මකව ගොනුකරනු ලැබිනි.

**ආර්ථික සාධක**

ප්‍රතිචාර දැක්වූවන් ඡන්දය ප්‍රකාශ කිරීම පිළිබඳව ගන්නා තීරණවල ආර්ථික අපේක්ෂාවන් සම්බන්ධයෙන් ග්‍රාමීය, නාගරික සහ වතුකර ප්‍රජාවන් අතර පැහැදිලි වෙනස්කම් පවතින බව මෙම අධ්‍යයනයේදී පෙනී ගියේය. නාගරික ප්‍රජාවන් (විශේෂයෙන් ම බස්නාහිර පළාතේ) බදු බර අඩු කිරීම සඳහා සහ භාණ්ඩ මිල සම්බන්ධ ගැටලු සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම වඩාත් වැදගත් ලෙස සලකන බව පෙනීයන ලදී. එයට සාපේක්ෂව, හම්බන්තොට, මොණරාගල, මාතර, අනුරාධපුරය වැනි ප්‍රදේශවල ප්‍රතිචාරදැක්වූවන් බොහෝ දෙනෙක් රසායනික පොහොර මිල අඩු කිරීම, කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍රවල බදු අඩු කිරීම සහ වගා හානි සඳහා වන්දි ලබා දීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළහ. බොහෝ තරුණ තරුණියෝ - විශේෂයෙන් ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිංහල ප්‍රජාවේ සහ උතුරේ ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවේ - විශ්වවිද්‍යාල උපාධිධාරීන් අතර විරැකියාව තීරණාත්මක ආර්ථික සාධකයක් යැයි ප්‍රකාශ කළහ. භාණ්ඩ මිල අඩු කිරීම, සහනාධාර ලබාදීම, පාසල් සිසුන්ට දිවා ආහාර සහ නිල ඇඳුම් ලබාදීම, වැඩිහිටියන්ට විශේෂ සහන සැලසීම, වතුකරයේ වැඩ කරන ජනතාවගේ වැටුප් වැඩි කිරීම අත්‍යවශ්‍ය බව මලයග දෙමළ නියැදියේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කළහ. සුභසාධනයට සම්බන්ධ කරුණු හැරුණු විට, මලයග ප්‍රජාවගේ ඉඩම් නොමැතිකම පිළිබඳ ගැටලුව විසඳීම ද තීරණාත්මක ආර්ථික සාධකයක් ලෙස ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් විසින් සලකනු ලබන බව සමීක්ෂණ ප්‍රතිඵලවලින් පෙන්නුම් කරයි. පශ්චාත් යුධ සමයේ සිදුවන ඉඩම් කොල්ලය සම්බන්ධ ගැටළු විසඳීමේ අවශ්‍යතාවද සිලාවතුර වැනි ප්‍රදේශවල ජනතාව විසින් ආර්ථිකය යන පුළුල් සන්දර්භය තුළට ගොනු කරන ලදී. ආර්ථික අර්බුදය හේතුවෙන් කාන්තාවන් විශාල වශයෙන් විදෙස්ගතවීම ද සැලකිය යුතු ආර්ථික ප්‍රශ්නයක් බව ත්‍රිකුණාමලය සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන් ප්‍රකාශ කළ අතර, රටේ ආර්ථික අර්බුදයට ඵලදායී ලෙස පිළියම් යෙදීම මගින් කාන්තාවන් රට හැර යාම අවම කළ හැකිය යන්න ඔවුන්ගේ අදහස විය. ශ්‍රී ලංකා දෙමළ නියැදියේ ප්‍රතිචාර දැක්වූවන් අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සමානව පොදුවේ ඉදිරිපත් කළ අනෙකුත් ආර්ථික කරුණුවලට අමතරව, ඔවුන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් නිවාස ප්‍රශ්නය පිළිබඳව මෙන්ම රජයේ සේවකයන්ගේ අඩු වැටුප් සම්බන්ධයෙන් ද සිය කනස්සල්ල පළ කළහ. ඡන්දය දීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී විවිධ ප්‍රජාවන් ප්‍රමුඛත්වය ලබා දෙන ආර්ථික සාධක අතර පුළුල් විවිධත්වයක් තිබෙන බව පැහැදිලි විය. ඒවා භාණ්ඩ මිල, සුභසාධනය, සමාජ ආරක්ෂණය සහ බදු අඩුකිරීමේ සිට නිෂ්පාදනය සහ රැකියා උත්පාදනය දක්වා වූ පුළුල් පරාසයකට අයත් විය.

මැතිවරණ කොමිසමේ මාර්ගෝපදේශය මත ඉවත් කරනු ලැබිනි.





21 වෙනි රූප සටහන: එක් එක් ජනවර්ගය තුල ආර්ථික සාධක ප්‍රමඛ ලෙස සැලකීම

**නීතියේ ආධිපත්‍යය**

'නීතියේ ආධිපත්‍යය' ආර්ථිකයෙන් පසු ප්‍රතිචාරකයින් වඩාත්ම සැලකිලිමත් වූ සාධකය විය. ප්‍රතිචාරකයින් අතරින් නීතියේ ආධිපත්‍යය කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූයේ මුස්ලිම් ප්‍රජාවට අයත් නියැදියයි. පිළිවෙලින් මුස්ලිම් ප්‍රජාවගෙන් 16.9% ක්, සිංහල ප්‍රජාවගෙන් 10% ක්, ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවගෙන් 7.9% ක් සහ මලයග දෙමළ ප්‍රජාවගෙන් 4.6% ක් තමන් නීතියේ ආධිපත්‍යය අනෙක් සියල්ලටම වඩා වැදගත් ලෙස සලකන බව ප්‍රකාශ කළහ. මුස්ලිම් ප්‍රජාවගේ නියැදියේ ප්‍රතිචාරකයින්ගෙන් බහුතරයක් නීතියේ ආධිපත්‍යය යන්නෙන් අදහස් කළේ ඔවුන් අතීතයේ (විශේෂයෙන් ම පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව) අත්විඳින ලද අසාධාරණයන්ට එරෙහිව නීතියේ සමාන රැකවරනය ලැබීමයි. නිවාස සෝදිසි කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම යනාදියේදී ඔවුන්ට එරෙහි වෙනස්කොට සැලකීමේ ආකල්පයකින් කටයුතු කරනු ලැබූ බව ඔවුහු විශ්වාස කරති. අන්තවාදී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ අය සොයනවා වෙනුවට, තම ප්‍රජාව තුළ සිටින දේශපාලනික වශයෙන් ක්‍රියාකාරී සාමාජිකයන් මර්දනය කිරීම සඳහා නීතිය අවභාවිත කළ බව ඔවුන්ගේ අදහස විය. කොවිඩ්-19 වසංගතය තුළදී මළ සිරුරු බලහත්කාරයෙන් ආදාහනය කිරීමේදී ද එම අසාධාරණය හා වෙනස්කොට සැලකීම සිදු වූයේ යැයි ඔවුහු සිතති. කිසිදු ප්‍රජාවක් වින්දිතභාවයට පත් නොවන සේ ආරක්ෂාව සලසමින්, සමානාත්මතාවයට සහ වෙනස්කොට නොසැලකීමට ගරුකරමින් නීතියේ ආධිපත්‍යය පෝෂණය කළ හැකි පාලන ක්‍රමයක් අවශ්‍ය බව ඔවුහු ප්‍රකාශ කළහ. එයට සමගාමීව, තමන්ගේ ඇඳුම් පැළඳුම් නිසා තමන්ව වෙනස්කොට සැලකීම්වලට භාජනයවන්නේය යන්න මුස්ලිම් කාන්තාවන්ගේ අදහස විය. පුද්ගලයෙකුගේ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමේ අයිතිය යටතේ තමන්ට අවශ්‍ය පරිදි ඇඳුම් ඇඳීම සඳහා නීතිමය රැකවරණය තිබිය යුතු යැයි ඔවුහු පැවසූහ.

ප්‍රතිචාරදැක්වූවන් ගෙන් බොහෝ දෙනෙක් වංචාව සහ දූෂණයට එරෙහිවීම ද නීතියේ ආධිපත්‍යය යන පුළුල් කාණ්ඩය යටතේ අර්ථනිරූපණය කළහ. අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ නොමැති විට වංචා සහ දූෂණ සිදු කරන පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති අවකාශය පිළිබඳ බලාපොරොත්තුවක් තබාගත නොහැකි බව විශේෂයෙන් ම නාගරික ප්‍රජාවේ ඇතැම්හු ප්‍රකාශ කළහ. 2015 වර්ෂයේ දී දූෂණ විරෝධී ක්‍රියාමාර්ග අතිශය වැදගත් වූ නමුත්, වත්මන් ආර්ථික අර්බුද සන්දර්භය තුළ එය පෙරට වඩා අඩු වැදගත්කමක් සහිත බව තවත් සමහරෙක් පැවසූහ. වංචා හා දූෂණ චෝදනා එල්ල වූ පුද්ගලයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා ජනතාව තවදුරටත් එය බරපතළ දෙයක් ලෙස නොසලකන බව ඇතැම් ප්‍රතිචාර දැක්වූවන්ගේ අදහස විය.

වංචාව සහ දූෂණය පිළිබඳ ගැටලුව විසඳීම සඳහා ප්‍රතිචාර දැක්වූවන් වඩාත්ම ප්‍රිය කළ අපේක්ෂකයා දැක්වූ තරුණයන් අතර මෙම ආකල්පය දැඩි ලෙස තිබුණි. බහුතරය වයස අවුරුදු 35 ට වැඩි පුද්ගලයන්ගෙන් සමහරෙක් පැවසුවේ ඔහු නියෝජනය කරන කඳවුර වංචාවට සහ දූෂණයට එරෙහිව දැඩි ලෙස කතා කළත් ඔවුන් ඒවා වැළැක්වීමට හා ඒවාට වගකිවයුත්තන්ට දඬුවම් කිරීමට ප්‍රමාණවත් ලෙස මැදිහත් වී නොමැති බව ය.





22 වෙනි රූප සටහන: එක් එක් ජනවර්ගය තුල නීතියේ පාලනය ප්‍රමබ ලෙස සැලකීම

**ජාතික ප්‍රශ්නය**

තමන් ඡන්දය ප්‍රකාශ කරන්නේ කුමන අපේක්ෂකයාටද යන්න තීරණය කිරීමේදී වඩාත්ම තීරණාත්මක සාධකය ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ ප්‍රවේශය කුමක්ද යන්න බව ප්‍රකාශ කළ අතරින් බහුතරය ශ්‍රී ලාංකා දෙමළ ප්‍රජාවට අයත් ප්‍රතිචාරකයින් වන අතර එය 10% ට ආසන්න විය. අනෙකුත් සියලු ම ජනවාර්ගික ප්‍රජාවන් අතරින් අනෙකුත් සියලු ම සාධකවලට වඩා ජාතික ප්‍රශ්නයට ප්‍රමුඛත්වය දුන් අයගේ ප්‍රතිශතය 5% ට වඩා අඩු විය. ජාතික ප්‍රශ්නය ප්‍රමුඛතම සාධකය ලෙස සැලකූ ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවගෙන් බහුතරයක් එය විසඳීම සඳහා නව නායකත්වයක් අවශ්‍ය බව විශ්වාස කළහ. ඔවුන් පවසන අන්දමට, ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ඉඩම් මංකොල්ලකෑමේ ප්‍රශ්නය සහ යුද්ධයේ දී සිදුවූ අසාධාරණයන් සහ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම ද අත්‍යවශ්‍ය වේ. තමන්ගේ ජනවර්ගයට අයත් නොවන කිසිදු අපේක්ෂකයෙක් මෙයට පිළියම් යොදනු ඇතැයි තමන්ට විශ්වාසයක් නැති බව බොහෝ දෙනා පැවසූහ. දෙමළ අපේක්ෂකයෙක් ජයග්‍රහණය නොකරන බව තමන් දන්නා නමුත් දෙමළ

නොවන නායකයෙකුට ඡන්දය දීමෙන් ද ඵලක් නොවන බව තමන් අත්දැකීමෙන් ම දන්නා බව ඇතැම් අය පැවසූහ. ජාතික ප්‍රශ්නය සඳහා වන ඕනෑම විසඳුමක පදනම වන්නේ ඉඩම් ප්‍රශ්නය විසඳීම බව ඉඩම් අහිමි සහ අවතැන්වූ පුද්ගලයන් සැලකිය යුතු සංඛ්‍යාවක් ජීවත් වන සිලාවතුර සහ ආලංකුඩා ප්‍රදේශවලට අයත් නියැදියේ සිටි මුස්ලිම් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු පිරිසකගේ අදහස විය. තමන් කුමන අපේක්ෂකයාට ඡන්දය දෙන්නේද යන්න තීරණය කිරීම සඳහා ජාතික ප්‍රශ්නය ප්‍රමුඛ සාධකයක් ලෙස සැලකූ සිංහල ප්‍රජාවේ ප්‍රතිචාරදැක්වූවන් (නියැදියෙන් 2%කට වඩා අඩු) ප්‍රධාන වශයෙන් ම පාස්කු ඉරු දින ප්‍රහාරයේ වින්දිතයන් වූහ. ඔවුන් ප්‍රකාශ කරන අන්දමට, පාස්කු ඉරිදා ප්‍රහාරය වැනි අනාගත අසාධාරණයන් සහ වින්දිතභාවයට පත්වීම් සැලකීමේ දී ජාතික ප්‍රශ්නය සඳහා වන ඕනෑම විසඳුමක් සමග සමාජ ආරක්ෂණ යාන්ත්‍රණයක් ද ඉදිරිපත් කළ යුතුය.

පොදුවේ සියලු ජනවර්ග අතර ජාතික ප්‍රශ්නයට ලබාදී තිබුණු ප්‍රමුඛතාවය අඩු වූ අතරම, දශක ගණනාවකට පසුව ජාතික ප්‍රශ්නය සහ ජාතිකවාදය මැතිවරණ ප්‍රචාරක කටයුතුවල එතරම් ප්‍රමුඛස්ථානයක් නොගත් පළමු ජනාධිපතිවරණය මෙය වීම ද විශේෂත්වයක් වේ. මෙම සන්දර්භය තුළ ප්‍රමුඛ සාධක ලෙස ජනවාර්ගික ආතතීන් ඇති නොවුනත්, ජාතික ප්‍රශ්නයෙහි තීරණාත්මකභාවය අපගේ සමාජයෙන් පහව ගොස් ඇතැයි අපට නිගමනය කළ නොහැක. උදාහරණයක් ලෙස, "මොන දේ සිද්ධ වුනත් අපිට රට බෙදන්න ඉඩ දෙන්න බෑ" වැනි ප්‍රකාශ ප්‍රතිචාර දැක්වූ සිංහල ප්‍රජාවේ සාමාජිකයන් අතර දුලබ නොවීය.





23 වෙනි රූප සටහන: එක් එක් ජනවර්ගය තුල ජාතික ප්‍රශ්ණය ප්‍රමඛ ලෙස සැලකීම

‘

## පවුලේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂපාතීත්වය

ඡන්දය දීම සම්බන්ධ තම තීරණය ගැනීමේදී සාම්ප්‍රදායිකව තම පවුලේ පක්ෂපාතිත්වය වඩාත් තීරණාත්මක සාධකය යැයි ප්‍රකාශ කළ ප්‍රතිචාරකයින්ගෙන් වැඩි දෙනෙක් මලයග දෙමළ ප්‍රජාවන්ට අයත් විය (27. 28%). එම ප්‍රතිශතය ශ්‍රී ලංකා දෙමළ, මුස්ලිම් සහ සිංහල සහ ප්‍රජාවන් අතර පිළිවෙළින් 14.89% සහ 11.79% ක් හා 7.69% ක් විය. නියැදියේ සිටි ප්‍රතිචාරදැක්වූවන් අතරින් තරුණයින්ට වඩා වැඩියෙන් වැඩිහිටි තැනැත්තන් තම පවුලේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂපාතිත්වය ඔවුන්ගේ තීරණය කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයක් ලෙස සැලකූහ.




24 වෙනි රූප සටහන: එක් එක් ජනවර්ගය තුල පවුලේ දේශපාලන නැඹුරුතා ප්‍රමඛ ලෙස සැලකීම

## අපේක්ෂකයාගේ ජන වාර්ගිකත්වය

සමීක්ෂණයට භාජනය කරන ලද ජනවාර්ගික ප්‍රජාවන් අතරින්, අපේක්ෂකයාගේ වාර්ගිකත්වය වඩාත්ම තීරණාත්මක සාධකය ලෙස සලකන්නේ යැයි ප්‍රතිචාරකයින්ගෙන් වැඩිම ප්‍රතිශතය (2%) ශ්‍රී ලංක දෙමළ ප්‍රජාවට අයත් විය. මලයග දෙමළ නියැදියට අයත් ප්‍රතිචාරකයින්ගෙන් කිසිවෙක් ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී අපේක්ෂකයාගේ ජන වාර්ගිකත්වයට ප්‍රමුඛත්වය ලබා දෙන බව ප්‍රකාශ නොකළ බව සඳහන් කිරීම වැදගත්වේ. තමන්ගේ වාර්ගික අනන්‍යතාවට අයත් අපේක්ෂකයෙක් කිසිදා මෙරට ජනාධිපති වනු අතැයි අපේක්ෂා කළ නොහැකි බව අවබෝධ කර ගැනීම මෙම තීරණයට හේතු වූ බව ඔවුහු පැවසූහ. ජනාධිපතිවරයා කුමන දේශපාලන පක්ෂයකට අයත් වුවද ඔහු හෝ ඇය සිංහලයෙකු වනු ඇති බව ඔවුන්ගේ මතය විය.

රටේ පවතින නීතිවලට අනුව මෙරට ජනාධිපතිවරයා විය හැක්කේ සිංහල බෞද්ධයෙකුට පමණක්ය යන්න තමන්ගේ අදහස වන බැවින් ඡන්දය දෙන්නේ කාටද යන්න තීරණය කිරීමේදී අපේක්ෂකයාගේ

ජනවාර්ගිකත්වය වැදගත් කරුණක් ලෙස නොසලකන බව සිංහල ප්‍රජාවේ ප්‍රතිචාරකයින් අතරින් වැඩි දෙනෙක් පැවසූහ. ජනාධිපතිවරයා සිංහල, බෞද්ධ විවාහක පුද්ගලයෙකු විය යුතු යැයි නීතියේ සඳහන් වන බව ඇතැම්හු විශ්වාස කළහ. ඒ අනුව, සිංහල ප්‍රජාවගේ නියැදියේ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 99% ට වැඩි ප්‍රමාණයක් අපේක්ෂකයාගේ ජනවාර්ගිකත්වය අදාළ නොවන බව ප්‍රකාශ කළ අතරම, සිංහල නොවන සහ බෞද්ධ නොවන අයෙකුට ජනාධිපතිවරයා වීමට නොහැකි ව්‍යවස්ථාමය බාධක පවතින බව සිංහල ජනතාවගෙන් අති බහුතරයක් තුළ විශ්වාසයක් පවතින බව පෙනෙන්නට තිබුණි.


දෙමළ පොදු අපේක්ෂකයකුද ඉදිරිපත්ව සිටින සන්දර්භයක් තුළ, ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධ තීරණ ගැනීමේ දී අපේක්ෂකයාගේ ජනවාර්ගිකත්වයට ප්‍රමුඛත්වය දිය යුතු යැයි ප්‍රතිචාර දැක්වූ ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවට අයත් පුද්ගලයන්ගේ ප්‍රතිශතය අඩුවීම (2%) පිළිබඳව විමර්ශනය කළ විට, එයට හේතුව දෙමළ ජාතික සන්ධානයේ නිහඬතාව යැයි ප්‍රතිචාරදැක්වූවන්ගෙන් බොහෝ දෙනෙක් පැවසූහ. දෙමළ ජාතික සන්ධානය උතුරේ අපේක්ෂකයාට සහාය පළකළ හොත් මෙම ප්‍රතිශතයෙහි පැහැදිලි වැඩිවීමක් දැකිය හැකි වනු ඇති බව ප්‍රතිචාරකයින් බොහෝ දෙනෙක් පැවසූහ.

**2019, 2015 සහ 2005 වර්ෂවල ජනාධිපතිවරණවලදී ජනතාවගේ ප්‍රමුඛතා**


ප්‍රතිචාරකයින්ට 2019, 2015 සහ 2005 වර්ෂවල පැවති ජනාධිපතිවරණ වලදී ඡන්දය දීම සම්බන්ධ තීරණ ගැනීමේ දී වැදගත් වූ ප්‍රමුඛතම සාධක මොනවාද යන්න පිළබඳව ද මෙම සමීක්ෂණයේදී විමසන ලදී. එම සියලු ජනාධිපතිවරණ වලදී ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයා පරාජයට පත්වී වෙනත් අපේක්ෂකයෙක් බලයට පත් වූ අතර එම පරිවර්තනය රටේ ජාතික ප්‍රශ්නය සඳහා ප්‍රවේශය, විදේශ සබඳතා, ඥාති සංග්‍රහය සහ බලයේ සිටින්නන්ට සමීප සහ ඉහළ මට්ටමේ දේශපාලන තීරණවලට බලපෑම් කරන ප්‍රභූ පැලැන්තියේ වෙනස්වීම් සිදුවීම වැනි විවිධ ආකාරවලින් රටේ දේශපාලන ගමන් මග වෙනස් කළේය.

2024 ජනාධිපතිවරණයට පෙර (2019, 2015, සහ 2005) ජනාධිවරණ වලදී ජනතාවගේ තීරණයට පදනම් වූ ප්‍රමුඛතම සාධක නිරීක්ෂණය කිරීමේදී ආර්ථික සාධකවල ප්‍රමුඛත්වය ක්‍රමයෙන් වැඩි වීම ප්‍රවණතාවක් ලෙස මතු විය. සමීක්ෂණය කරන ලද සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර මෙම ප්‍රවණතාවය තිබෙන බව නිරීක්ෂණය කළ හැකි විය. ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් හතර අතරින් මුස්ලිම් ප්‍රජාවට අයත් ප්‍රතිචාර දැක්වූවන් ඡන්දය දීම සම්බන්ධ තීරණ ගැනීමේදී අනෙකුත් සියලු ම සාධකවලට වඩා ආර්ථිකය පිළිබඳ සාධකය අධිනිශ්චය කිරීමේ අඩුම ප්‍රතිශතය පෙන්නුම් කළහ. පසුගිය ජනාධිපතිවරණ තුනේදී නීතියේ ආධිපත්‍යය හෝ ජාතික ගැටලුව සම්බන්ධ ප්‍රවේශය ඔවුන්ගේ ප්‍රමුඛතාවය ලෙස පැවති බව මුස්ලිම් ප්‍රජාවෙහි ප්‍රතිචාර තුලින් පෙනී ගියේය. 2015 සහ 2005 මැතිවරණවල දී ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාවේ ප්‍රතිචාරකයින්ගේ මූලික අවධානය යොමු වූයේ ජාතික ප්‍රශ්නය කෙරෙහි ය. 2005 වර්ෂයේ දී සිංහල ප්‍රජාවේ ප්‍රතිචාර දැක්වූවන්ගේ මූලික අවධානය වූ ජාතික ප්‍රශ්නය, 2015 වර්ෂයේ දී ආර්ථික සාධක සහ නීතියේ ආධිපත්‍යය / දූෂණ-විරෝධය වෙත ද, 2019 වර්ෂයේ දී ආර්ථික සාධක වෙත ද මාරු වී ඇත. එබැවින්, එක් එක් මැතිවරණයේ දී මැතිවරණ කතිකාවේ ප්‍රමුඛතම ආඛ්‍යානය සිංහල ප්‍රජාව මත බලපෑමක් ඇතිකර තිබෙන බව, නැතහොත්, සිංහල ප්‍රජාවගේ අවශ්‍යතා එක් එක් මැතිවරණ කාලයේ දී ජනප්‍රිය කතිකාවේ ප්‍රමුඛ ආඛ්‍යානය බවට පත්ව ඇති බව උපකල්පනය කළ හැක. අනෙක් අතට, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් එකී කතිකාව තම ප්‍රජාව කෙරෙහි අදාළත්වය සහ එහි බලපෑම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කර ඇත. දකුණේ මැතිවරණ ව්‍යාපාරය තුළ දෙමළ විරෝධී හැඟීම් ප්‍රමුඛ වන විට, ශ්‍රී ලාංකික දෙමළ ප්‍රජාව ජාතික ප්‍රශ්නය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, මුස්ලිම් ප්‍රජාව අතර ද එය එලෙසින් ම සිදුවී ඇත. කෙසේ වෙතත්, වර්තමාන ආර්ථික අර්බුදයේ සන්දර්භය තුළ, ඡන්දය දීම පිළිබඳ තීරණ ගැනීමේ තීරණාත්මක සාධකයක් ලෙස ජාතික ප්‍රශ්නය කෙරෙහි


ඇති ප්‍රමුඛතාවය අඩු වී ඇති අතර ආර්ථික සාධක වඩාත් තීරණාත්මක සාධක ලෙස ඉස්මතු වී තිබේ. මලයග දෙමළ ප්‍රජාව අතර පවුලේ සාම්ප්‍රදායික පක්ෂපාතීත්වය වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇතත්, එම තත්ත්වය ක්‍රමයෙන් හීන වෙමින් පවතින බව මෙම අධ්‍යයනය මගින් පෙන්නුම් කරයි. 2005 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ ජනාධිපතිවරණ වලදී ඡන්දය දීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී ජාතික ප්‍රශ්නය කෙරෙහි ඇති ප්‍රමුඛතාවය ක්‍රමයෙන් අඩුවී, ආර්ථිකය සම්බන්ධ කරුණු කෙරෙහි ඇති ප්‍රමුඛතාවය ඉහළ ගොස් ඇති බව වර්තමාන අධ්‍යයනය තුළින් පෙනීයන අතර, මේ පිළිබඳව තවදුරටත් ගැඹුරින් අධ්‍යයනය කළ යුතු වේ.




25 වෙනි රූපසටහන: 2019 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු





26 වෙනි රූපසටහන: 2015 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු





27 වෙනි රූපසටහන: 2005 ජනාධිපතිවරණයේ දී තීරණ ගැනීමේ දී ප්‍රමුඛතාවය දුන් කරුණු


තමන්ගේ අපේක්ෂාවන්ට ගැළපෙන අපේක්ෂකයා කවුරුන්ද යන්න තීරණය කරන්නේ කෙසේදැයි විමසූ විට, තමන්ගේ ප්‍රධානම තොරතුරු මූලාශ්‍රය මාධ්‍ය වන බව ප්‍රතිචාර දැක්වූවන්ගෙන් බහුතරයක් දෙනා පැවසූහ (සිංහල - 55%, ශ්‍රී ලංකා දෙමළ - 48%, මුස්ලිම් - 41% සහ මලයග දෙමළ-29%). ඊළඟට වැදගත් තොරතුරු මූලාශ්‍රය වූයේ ඔවුන්ගේ සමාජ සම්බන්ධතා විය (සේවා ස්ථානය, වෘත්තීය සමිති, ග්‍රාමීය සමිති, සුබසාධක සංගම්, ආගමික සමිති ආදිය). මුස්ලිම්වරුන්ගෙන් 25% ක්, මලයග දෙමළ ප්‍රජාවන්ගෙන් 23%ක්, ශ්‍රී ලංක දෙමළ ප්‍රජාවගෙන් 22% ක් සහ සිංහල ප්‍රජාවගෙන් 13% ක් ප්‍රධාන වශයෙන් ම තම සමාජ සම්බන්ධතා හරහා ලැබෙන තොරතුරු මත විශ්වාසය තබා සිටින බව පැවසූහ. තමන්ගේ පවුල සහ සමීප පවුල් ජාලය හරහා ලැබෙන තොරතුරු තමන් තුළ වැඩි බලපෑමක් ඇතිකරන බව මලයග දෙමළ ප්‍රජාවගේ නියැදියෙන් 27% ක් ප්‍රකාශ කළහ. සිංහල නියැදිය තුළ එය 18% ක් ද, මුස්ලිම් නියැදිය තුළ 17% ක් ද වූ අතර, ශ්‍රී ලංකා දෙමළ නියැදිය තුළ එය 12% ක් ලෙස අඩුම අගය ගත්තේය.





28 වෙනි රූපසටහන: මූලික තොරතුරු මූලාශ්‍රය (සිංහල)




29 වෙනි රූපසටහන: මූලික තොරතුරු මූලාශ්‍රය (ශ්‍රී ලංකා දෙමළ)





30 වෙනි රූපසටහන: මූලික තොරතුරු මූලාශ්‍රය (මුස්ලිම්)





31 වෙනි රූපසටහන: මූලික තොරතුරු මූලාශ්‍රය (මලයග දෙමළ)

අවසාන වශයෙන්, තමන් ඡන්දය දුන් අපේක්ෂකයා මැතිවරණයෙන් ජයග්‍රහණය කළ පසුව ඔහු තම අපේක්ෂාවන් ඉටු නොකර විශ්වාසය කඩ කරන්නේ නම් තමන් කුමක් කරන්නේ දැයි ප්‍රතිචාරකයින්ගෙන් විමසා සිටින ලදී. ඔහුව ධුරයෙන් ඉවත් කිරීම සඳහා මීළඟ ජනාධිපතිවරණය එන තෙක් බලා සිටින බව ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවේ ප්‍රතිචාර දැක්වූවන් හැර අනෙකුත් සියලු ම ජනවාර්ගික කණ්ඩායම්වල ප්‍රතිචාරකයින්ගේ බහුතරය පැවසූහ (සිංහල - 35.6%, මුස්ලිම් 36.1%, සහ මලයග දෙමළ - 54.2%).


මීළඟ ජනාධිපතිවරණය එන තෙක් බලා නොසිට ඉදිරි මැතිවරණවලදී ඔහු නියෝජනය කරන කඳවුරට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කර තම අතෘප්තිය ප්‍රකාශ කරන බව ශ්‍රී ලාංකා දෙමළ නියැදියේ ප්‍රතිචාරකයින්ගෙන් වැඩි දෙනෙක් ප්‍රකාශ කළහ. සියලු ජනවර්ගවල නියැදි අතරින් මහජන විරෝධතා වලට යොමු බව පැවසූ ප්‍රතිචාරදැක්වූවන් ප්‍රමාණය 9% ට වඩා අඩු විය. මහජන විරෝධතා හරහා ජනාධිපතිවරයෙකු බලයෙන් පහකර වසරක් දෙකක් ගතවී ඇතත් උද්ඝෝෂණවලට යොමුවීමට ජනතාව අකැමැති බව පෙනෙන්නට තිබීම සැලකිය යුතු කරුණක් වේ. තම අපේක්ෂාවන් ඉටු නොකර විශ්වාසය කඩකිරීමක් සිදු කළ හොත් ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ තමන්ට අදහසක් නොමැති බව සෑම නියැදියකම සැලකිය යුතු ප්‍රතිශතයක් ප්‍රකාශ කළහ (සිංහල - 29.2%, ශ්‍රී ලංකා දෙමළ - 25%, මුස්ලිම් - 29.8%, සහ මලයග දෙමළ - 25%).





32 වෙනි රූපසටහන: පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (සිංහල)




34 වෙනි රූපසටහන: පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (මුස්ලිම්)




33 වෙනි රූපසටහන: පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (ශ්‍රී ලංකා දෙමළ)




35 වෙනි රූපසටහන: පොරොන්දු පාවාදීම සම්බන්ධ ප්‍රතිචාරය (මලයග දෙමළ)

**සමාලෝචනය**

එළඹෙන ජනාධිපතිවරණය අරගලයෙන් පසු මෙරට නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ජනතාව ස්වකීය හඬ ප්‍රකාශ කරන පළමු මැතිවරණය වේ. අනෙක් අතට, සෑමවිටම සිදුවී ඇති ආකාරයට, ජනාධිපතිවරණ වලදී ගනු ලබන තීරණ රටේ දේශපාලන සංවිධානය කෙරෙහි වැඩිම බලපෑමක් ඇති කරයි. මෙම සන්දර්භය තුළ, සියලු ම ජනවාර්ගික ප්‍රජාවන්හි ඡන්දදායකයින් ගෙන් බහුතරයක් තම ඡන්දය දීමට ඇති උනන්දුව ප්‍රකාශ කිරීම පුදුමයට කරුණක් නොවේ. වර්තමාන අධ්‍යයනය මගින් සොයාගත් කරුණුවලට අනුව, සිංහල ප්‍රජාවගෙන් අතිබහුතරයක් ඡන්දය දීමට කැමති අතර, ඔවුන්ගෙන් බහුතරය වයස අවුරුදු 35 ට අඩු තරුණ ඡන්දදායකයන් වේ. එසේම ඔහු මුස්ලිම් ප්‍රජාව අතර ද අනෙකුත් අපේක්ෂකයන්ට වඩා ජනප්‍රියවී ඇත. සිංහල හා මුස්ලිම් ප්‍රජාවෙහි වඩා වැඩිහිටි ඡන්දදායකයන් අතර වඩාත් ජනප්‍රියවී ඇත.

කෙසේ වෙතත්, සමස්ත මනාපය සැලකීමේ දී මුස්ලිම් ප්‍රජාව අතර වඩා ඉදිරියෙන් සිටියි. ශ්‍රී ලංක දෙමළ සහ මලයග දෙමළ ජනතාව අතර වඩාත්ම ජනප්‍රිය අපේක්ෂකයා වේ. දෙවනුවට කැමති අපේක්ෂකයා වේ. තවද, මෙම ප්‍රජාවන් දෙකෙහිම වඩාත් වැඩිහිටි ඡන්දදායකයන් අතර වැඩි ජනප්‍රියත්වයක් දිනාගෙන ඇත. ජනවර්ග හතරෙහිම නියැදිවල ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් තමන් ඡන්දය දෙන අපේක්ෂකයා පිළිබඳව තීරණය කර නොතිබීම සහ තවත් සැලකිය යුතු ප්‍රතිශතයක් තමන් ඡන්දය දෙන්නේ කුමන අපේක්ෂකයාටද යන්න ප්‍රකාශ කිරීමට කැමැත්තක් නොදැක්වීම නිසා, මෙම සමීක්ෂණයෙහි ප්‍රතිඵල මගින් ප්‍රක්ෂේපණය කරන්නේ සිංහල ප්‍රජාවගෙන් 60% ක ගේ මනාපය, ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාවගෙන් 45% ක මනාපය, මුස්ලිම් ප්‍රජාවගෙන් 60% ක මනාපය සහ මලයග දෙමළ ප්‍රජාවගෙන් 55% ක මනාපය පමණි.

පසුගිය ජනාධිපතිවරණ සමග සංසන්දනය කිරීමේ දී, මෙවර ජනාධිපතිවරණයේ දී සෑම ජනවර්ගයකටම අයත් ඡන්දදායකයින් තමන්ගේ තේරීම සිදුකිරීමේ දී මූලික අවධානය යොමු කර ඇත්තේ ආර්ථික සාධක කෙරෙහි ය. විවිධ ජනවර්ග, විවිධ අංශ සහ විවිධ ප්‍රදේශ අතර තීරණාත්මක ආර්ථික සාධකය ලෙස වටහා ගන්නා දෙයෙහි වෙනසක් ඇත. ඒවා භාණ්ඩ මිල, සුභසාධනය සහ සමාජ ආරක්ෂණයේ සිට කෘෂිකර්මාන්තයට පහසුකම් සැලසීම, බදු අඩු කිරීම සහ රැකියා උත්පාදනය දක්වා වූ පුළුල් පරාසයකට අයත් වේ. අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සංසන්දනය කිරීමේ දී, මුස්ලිම්වරුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නීතියේ ආධිපත්‍යයෙහි වැදගත්කමට (ආර්ථික සාධකවලට පසුව) ප්‍රමුඛත්වය දී ඇති අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් එය පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව ඔවුන් ලැබූ අත්දැකීම් හා සම්බන්ධ කරති. ජාතික ප්‍රශ්නය කෙරෙහි ඉහළම උනන්දුවක් දක්වන ලද්දේ ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාව විසින් වන අතර (නමුත් එය ආර්ථික සාධකවලට වඩා බොහෝ සෙයින් අඩුය) ඉඩම් කොල්ලකෑම් සහ පශ්චාත් යුද සමයේ අනෙකුත් දුක්ගැනවිලි පිළිබඳ ප්‍රශ්නය විසඳීමේ අවශ්‍යතාවය ද එයට ඇතුළත් විය. මුස්ලිම්වරුන්ගෙන් යම් කොටසක් (විශේෂයෙන් 1990 දී උතුරේ අවතැන් වූවන්) සහ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත් වූවන් (සිංහලයන්) ජාතික ප්‍රශ්නය යටතේ තම ගැටළු රාමුගත කළ අතර, එමගින් ජාතික ප්‍රශ්නයේ තිබෙන බහුවිධ ස්වභාවය පෙන්නුම් කරයි. අනෙකුත් ජනවර්ගවලට වඩා මලයග දෙමළ ප්‍රජාව අතර පවුලේ සාම්ප්‍රදායික දේශපාලන පක්ෂපාතීත්වය තීරණාත්මක සාධකයක් ලෙස ඉහළ මට්ටමක පැවතුණි.

අපේක්ෂකයා අයත් වන ජන වර්ගය මුස්ලිම්වරුන් සහ මලයග දෙමළ ජනයා විසින් අඩුවෙන්ම ප්‍රමුඛත්වය ලබා දුන් සාධකය වේ. එයට සාපේක්ෂව, සියලු ජනවාර්ගික නියැදි අතරින්, අපේක්ෂකයා අයත් වන ජන වර්ගයට ප්‍රමුඛත්වය දීමේ ඉහළම ප්‍රතිශතය ශ්‍රී ලංකා දෙමළ ප්‍රජාව විසි-න් පෙන්නුම් කළ අතර, එහෙත් එය අනෙකුත් සාධක හා සංසන්දනය කිරීමේ දී සාපේක්ෂ වශයෙන්

අඩු ප්‍රතිශතයක් විය. සිංහලයන්ගෙන් අතිමහත් බහුතරයක් මෙරට නීතියට අනුව රටේ ජනාධිපති විය හැක්කේ සිංහල-බෞද්ධයෙකුට පමණක් යැයි විශ්වාස කළ නිසා අපේක්ෂකයාගේ ජනවාර්ගිකත්වය ගැන සලකා බැලීම අනවශ්‍ය බව සිතුහ.

2019, 2015 සහ 2005 වර්ෂවල පැවති ජනාධිපතිවරණ සමග සංසන්දනය කිරීමේ දී, මෙවර ජනාධිපතිවරණය පිළිබඳ කතිකාව තුළ ජාතික ප්‍රශ්නයෙහි ඇති තීරණාත්මකභාවයෙහි අඩුවීමක් තිබෙන බව නිරීක්ෂණය කළ හැක. එයට සමගාමීව, මුස්ලිම් සහ සිංහල ජනයාගේ දුක්ගැනවිලි (විශේෂයෙන් පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව) මෙයට පෙර සිංහල සහ දෙමළ ජනයාට සීමාවී තිබූ ජාතික ප්‍රශ්නයට නව මානයක් එක් කර ඇත, වර්තමාන සන්දර්භය තුළ, ආර්ථිකය, නීතිය හා සාමය සහ අනන්‍යතාවය සම්බන්ධයෙන් සියලු ජනවාර්ගික ප්‍රජාවන්ගේ තුළ ඇති විවිධ දුක්ගැනවිලි ද ජාතික ප්‍රශ්නයට සම්බන්ධව තිබේ. එබැවින් අනාගත රජයන්ට ජාතිය ගොඩනැගීමේ ක්‍රියාවලියක් තුළ මෙකී බහුවිධ මානයන් ඇතුළත් කරගනිමින් සියලු ප්‍රජාවන්ගේ දුක්ගැනවිලි විසඳීමට සිදුවනු ඇත. සාම්ප්‍රදායික පවුල් පක්ෂපාතිත්වය ක්‍රමක්‍රමයෙන් දුර්වල වීමේ වැදගත්කම අනාගතය සඳහා යහපත් ලක්ෂණයකි.

ඡන්දදායකයින් තම ඡන්දය ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී පදනම් කර ගන්නා ප්‍රධානම තොරතුරු මූලාශ්‍රය මාධ්‍ය වේ. එබැවින් ඡන්දදායකයින්ට දැනුවත්භාවයෙන් යුතුව, අපක්ෂපාතී තොරතුරු මත පදනම්ව තීරණ ගත හැකි නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා මාධ්‍යවල කාර්යභාරය ඉතා වැදගත් වේ. පක්ෂග්‍රාහී වාර්තාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍යවලට විවිධ චෝදනා එල්ල වී ඇති සන්දර්භයක් තුල මෙය අවධානයට ලක්විය යුතු ප්‍රධාන කරුණක් වේ. යම් අපේක්ෂකයින් සම්බන්ධයෙන් අපහාසාත්මක අදහස් පළ කරමින් සහ තෝරාගත් අපේක්ෂකයින් විවේචනය තරමින් මාධ්‍ය ආචාර ධර්මවලට නොගැළපෙන ආකාරයට හැසිරීම සම්බන්ධයෙන් පසුගියදා මැතිවරණ කොමිසම ඇතැම් මාධ්‍ය ආයතන වෙත අනතුරු ඇඟවීම් නිකුත් කළේ ය. තීරණ ගැනීම සම්බන්ධයෙන් බලපෑමක් ඇතිකරන ප්‍රධානම මූලාශ්‍රය ලෙස සමාජ සම්බන්ධතා මත විශ්වාසය තැබීම අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට වඩා සිංහල ප්‍රජාව තුළ අඩු ප්‍රතිශතයක් විය. පවුල් ජාලය හරහා ලැබුණු තොරතුරු වල වැදගත්කම අනෙක් ප්‍රජාවන්ට සාපේක්ෂව මලයග දෙමළ ප්‍රජාව තුළ ඉහළ මට්ටමක පැවතුණි.

සියලු ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් ප්‍රතිචාරකයින්ගෙන් අතිමහත් බහුතරයක් තමන් තෝරාගත් අපේක්ෂකයා මැතිවරණ පොරොන්දු කඩකළ හොත් එයට එරෙහිව ප්‍රසිද්ධියේ විරෝධතා දැක්වීමේ විකල්පය තෝරා ගැනීම පිළිබඳව සැලකිල්ලක් නොදක්වන බව පැහැදිලි ය. ඒ වෙනුවට, බහුතරයක් දෙනා එයට ප්‍රතිචාර දැක්වීම සඳහා ඊළඟ ජනාධිපතිවරණය හෝ වෙනත් මැතිවරණ එළඹෙන තුරු බලා සිටීමේ විකල්පය තෝරා ගත්හ. කෙසේ වෙතත්, සෑම ප්‍රජාවක් තුළ ම ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 25% ක් පමණ එවැනි තත්වයක් ඇතිවුව හොත් කවර ආකාරයක දේශපාලන ප්‍රතිචාරයක් දැක්විය යුතු දැයි සිතාගත නොහැකි බව ප්‍රකාශ කළහ. මෙය අරගලය තුළ ප්‍රදර්ශනය වූ ජනතා දේශපාලන සවිඥානකත්වය පරිවර්තනය කිරීමේ අදහසට අභියෝගාත්මක වේ. ඒ අනුව, අරගලයෙන් පසු ජනතාවගේ දේශපාලන සවිඥානකත්වය වෙත ඇතිවී ඇති බලපෑම පිළිබඳ වැඩිදුරටත් අධ්‍යනය කිරීම වැදගත් වනු ඇත.

2024 ජනාධිපතිවරණය අරගලයෙන් පසුව පැවැත්වෙන පළමු මැතිවරණය ලෙස සහ ජනවරමක් සහිත නීත්‍යානුකූල ජනාධිපතිවරයෙකු පත්කර ගැනීම සඳහා ලැබෙන අවස්ථාවක් ලෙස ඉතාමත් තීරණාත්මක මැතිවරණයක් වේ. අනෙක් අතට, තේරී පත් වන ජනාධිපතිවරයා තමන්ගේ විවිධ ආර්ථික ගැටළු වලට විසඳුම් ලබා දෙනු ඇතැයි ජනතාව ඉමහත් බලාපොරොත්තු තබා ඇත. මෙම බලාපොරොත්තු සුභසාධනය සහ ජීවන වියදම් අඩු කිරීම තුළින් සාක්ෂාත් කර ගත හැකි කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභවලට පමණක් සීමා නොවේ. ජනතාවට තමන්ගේ ආර්ථික හා දේශපාලන අනාගතය

සම්බන්ධයෙන් පුළුල්, විස්තීර්ණ සහ දිගුකාලීන අපේක්ෂාවන් ඇත. ආර්ථික කතිකාව හේතුවෙන් යටපත්වී තිබුණ ද, ජනවාර්ගික දුක්ගැනවිලි සහ ජාතිකවාදය මැලවී ගොස් නැති අතර, ජාතිය යළි ගොඩනැගීම ද අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක් වී තිබේ. එයට සමගාමීව, නීතියේ ආධිපත්‍යය ස්ථාපනය කරන ලෙස ද ජනතාව දැඩි ලෙස ඉල්ලා සිටිති. එබැවින්, වර්තමාන "දෙපැත්තක තුන්කොන් සටන" ජයග්‍රහණය කරන කවර හෝ අපේක්ෂකයා පිළිබඳ ජනතාව තුළ තිබෙන අපේක්ෂාවන් ඉතා ඉහළ ය.

“

ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය.

3 වන ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික
සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

”


LAW & SOCIETY TRUST
නීතිය හා සමාජ භාරය
சட்டம் மற்றும் சமூக நம்பிக்கை

**Law & Society Trust**
3, Kynsey Terrace,
Colombo 8, Sri Lanka.
www.lstlanka.org

9 786245 545308

ISBN 978-624-5545-30-8